**කොළඹ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව**
**නීති පීඨය**
**නීතිවේදී උපාධි පරීක්ෂණය, III වසර - 2019**

# අන්තර්ජාතික මානුෂවාදී නීතිය

(පැය තුනයි)

මුළු ප්‍රශ්න සංඛ්‍යාව: 07

ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න.

(අපැහැදිලි අත් අකුරු සඳහා ලකුණු අඩු කරනු ලැබේ.)

---

1. ත්‍රස්තවාදය විසින් මතු කරනු ලබන අභියෝගයන් නිරාකරණය කිරීම සඳහා අන්තර්ජාතික මානුෂවාදී නීතිමය රාමුව ප්‍රමාණවත් වන්නේ ද යන්න පිළිබඳව විවේචනාත්මකව අදහස් දක්වන්න. නීතිමය අධිකාරීන් සහ උදාහරණ උපුටා දක්වමින් ඔබේ පිළිතුර සනාථ කරන්න.

2. හරිකානා සහ සේගෝ යනු අසල්වැසි රාජ්‍යයන් දෙකකි. හරිකානාහි සුළුතරය වික්ටෝරියානුවන් වන අතර ඔවුහු සේගෝහි බහුතරය වෙති. හරිකානාහි බලධාරීන්ට එරෙහිව වික්ටෝරියානුවන් විසින් ගැටුම් කිහිපයක් මෙහෙයවා ඇත. හරිකානාහි සුළු ජාතීන්ගේ අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම පිළිබඳව පවතින චෝදනා පිළිබඳව සේගෝ අප්‍රසාදය පළකරන අතර, දකුණු හරිකානාහි පිහිටි අවි ආයුධ නිෂ්පාදන කම්හලකට එරෙහිව සෙනසුරාදා දින ප්‍රහාරයක් දියත් කිරීමට ඔවුන් තීරණය කර ඇත. කෙසේවෙතත්, ආයුධ පද්ධතියේ ඇතිවූ අසමත්වීමක් හේතුකොටගෙන සිකුරාදා දින කම්හල තුළ පිපිරීමක් ඇතිවී ඇත. මෙම පිපිරීම නිසා කිහිපදෙනෙකු මරණයට පත්වී සේවකයන් සියගණනක් තුවාල ලබා ඇත. බුද්ධි තොරතුරු මගින් හඳුනා ගන්නා ලද සේගෝ හමුදා ඒකක කිහිපයකට එදිරිව ගුවන් ප්‍රහාරයක් දියත් කිරීමට හරිකානා තීරණය කර ඇත. එනමුත් තෝරාගත් ඉලක්කයට නිසි ආකාරයට ප්‍රහාර එල්ල කිරීමට හරිකානා හමුදාවට නොහැකි වී ඇති අතර, සතුරු භූමි ප්‍රදේශයට ඉහලින් ඔවුන් අහඹු ලෙස බෝම්බ හෙලා ඇත. සේගෝ විසින් පවසනු ලබන්නේ සිවිල් වැසියන් සඳහා ආරක්ෂා ස්ථානයක් ලෙස භාවිතා කරන ලද, ඔවුන්ගේ හමුදාමය ගොඩනැගිලිවලට යාබදව තිබූ පරිශ්‍රය මෙම බෝම්බ හෙලීම නිසා බරපතල ලෙස හානියට පත්වී ඇති බවයි. සිවිල් වැසියන් විශාල ප්‍රමාණයක් ඝාතනයට ලක්ව ඇතිබව වාර්තා වේ. ප්‍රධාන වතුර ටැංකිය ද අර්ධ වශයෙන් විනාශ වී ඇත. හරිකානා හමුදාවන් විසින් සේගෝ සටන්කරුවන්ට පහරදීම වැලැක්වීම සඳහා සේගෝ ගොවීන් පස්දෙනෙකු ස්වකැමැත්තෙන් මිනිස් පලිහ ලෙස කටයුතු කිරීමට තෝරාගෙන ඇති බව වාර්තා වලින් අනාවරණය වේ.

අන්තර්ජාතික මානුෂවාදී නීතිය යටතේ අදාළ පාර්ශවයන්ගේ වගකීම් අගයන්න.

3. කොෂි සහ මේරු යනු සන්නද්ධ ගැටුමක නිරතව සිටින අසල්වැසි රාජ්‍යයන් දෙකකි. වාර්තාවන අන්දමට, මේරු විසින් 'ගිනි' නමැති ආයුධයක් නිපදවා ඇති අතර මෙම ආයුධයට ගිනි ධාරාවක් ප්‍රක්ෂේපනය කිරීමේ හැකියාව ඇත. චන්ද්‍රිකා ඡායාරූපයන් වලින් ඔප්පු වන්නේ මේරු විසින් එවැනි ආයුධයක් පිළිබඳව පර්යේෂණ කරන බව සහ, මෙම ආයුධයේ ප්‍රක්ෂේපනයට හසුවන සියලු ම දෑ දවා අළු කරලීමට මෙම ආයුධයට හැකියාව ඇති බවයි. මේරුහි හමුදාපති ටොන්ගා පවසන ආකාරයට කොෂි හමුදාවන් විසින් මේරු භූමි ප්‍රදේශයට ඉහලින් ගුවන් ආයුධයක් භාවිතා කරමින් දියරයක් ඉසීම නිසා වින්දිතයන් ආම්ලික පිළිස්සුම් ලැබීම හෝ ජීවිතක්ෂයට පත්වීම සිදුව ඇත. මෙම දියරය නිසා එක ගොවි මහතෙකුගේ මුළු වගාවම විනාශ වී ඇත. මෙම දියරයෙන් නෑවී යාම නිසා වනාන්තරයේ පාගමනක් යමින් සිටි තරුණ සිසුන් කණ්ඩායමක් මුහුණේ සහ චර්ම තුවාල වලට ලක් වී ඇත. සිසුන් දෙදෙනෙකුට අර්ධ වශයෙන් තම දෘෂ්ටිය අහිමි වී ඇත. කොෂිහි හමුදාපති ලූමා පවසන ආකාරයට එම ගුවන් ආයුධය, හඳුනාගත් හමුදාමය වස්තූන්ට ඉලක්ක කර ප්‍රහාරයන් එල්ල කළහැකි අති නවීන ආයුධයකි. තවද, මේරු විසින් 'ගිනි' නිපදවා පිළිගත් නීතීන් උල්ලංඝනය කිරීමට ගන්නා තැත ලූමා විසින් හෙලා දකින ලදී. ටොන්ගා පවසන ආකාරයට ඔවුන් උත්සාහ දරන්නේ මෙරුහි යුදමය ශක්තිය ඉහල නංවා ගැනීමට පමණි. එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලය විසින් මෙම තත්ත්වය පිළිබඳ නෛතික මතය විමසීම සඳහා අන්තර්ජාතික යුක්ති අධිකරණය වෙත යොමු කිරීමට තීරණය කර ඇත.

ඔබ ජාත්‍යන්තර සඟරාවක් සඳහා ලිපි සපයන අන්තර්ජාතික මානුෂවාදී නීතිය පිළිබඳ විද්වතෙකු බව උපකල්පනය කරන්න. කොෂි සර මේරු යන රාජ්‍යයන් දෙක ම එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාමාජික රාජ්‍යයන් බව ද, ඔවුන් 1949 ජිනීවා සම්මුතීන්ට සහ 1977 අතිරේක ප්‍රොටෝකෝලයන්ට පාර්ශවකාර රාජ්‍යයන් බව ද උපකල්පනය කරමින් ඉහත කරුණු විශ්ලේෂණය කරන්න.

4. 'සන්නද්ධ ගැටුමක් පවතින අවස්තාවකදී විවිධ හේතූන් මත ගැටුමට සම්බන්ධ නොවී සිටින පුද්ගලයන් ආරක්ෂිත පුද්ගලයන් (protected persons) ලෙස සැලකේ. කෙසේවෙතත්, විවිධ වර්ගයේ ආරක්ෂිත පුද්ගලයින්ට ලබා දී ඇති රැකවරණයෙහි ස්වභාවය හා ප්‍රමාණය රඳා පවතින්නේ එවැනි පුද්ගල වර්ගීකරණ මත පමණක් නොව, සන්නද්ධ ගැටුමේ ස්වභාවය මත ද පදනම්වය. එසේ ලබාදී ඇති ආරක්ෂාව අවසාන වන්නේ එම විශේෂ ආරක්ෂාව අවභාවිතා කිරීම නිසා හෝ විශේෂ රැකවරණයක් ලබා දීම ප්‍රායෝගිකව කළ නොහැකි අවස්ථාවන්හිදී පමණි.'

ඔබ, ඉහත ප්‍රකාශය සමඟ එකඟ වන්නෙහිද? අදාළ නෛතික ප්‍රතිපාදනයන්, නඩු තීන්දු නීතිය සහ නිදර්ශන ගෙනහැර දක්වමින් ඔබේ පිළිතුරට හේතු සපයන්න.

5. මිනා සහ වීටා යනු මිනාහි උතුරු ප්‍රදේශයේ සන්නද්ධ ගැටුමක නියැලී සිටින රාජ්‍යයන් දෙකකි. මිනා රාජ්‍යයේ හමුදාවන් 'මිනාටිස්' නමැති සන්නද්ධ කණ්ඩායමක් සමඟ ද යුද වදිමින් සිටිති. මිනා සහ වීටා රාජ්‍යයන් 1949 ජිනීවා සම්මුතීන්ට සහ 1977 පළමු අතිරේක ප්‍රොටෝකෝලයට පාර්ශවකාර රාජ්‍යයන් වන්නේයැයි උපකල්පනය කරමින් පහත සඳහන් වාර්තාගත අවස්ථාවන්හිදී අන්තර්ජාතික මානුෂවාදී නීතිය බරපතල උල්ලංඝනය කිරීම්වලට ලක්වී ඇත්දැයි විශ්ලේෂණය කරන්න.

(අ) වීටා සටන්කරුවන් අවි බිම තබා යටත් වන විටදී පවා මිනා සටන්කරුවෝ ඔවුන්ව කෲර ලෙස ඝාතනය කර ඇත. මිනා, වීටා සටන්කරුවන්ට එරෙහිව, අන්ධ කිරීමේ ලේසර් ආයුධ භාවිතා කර ඇත.

(ආ) මිනාහි උතුරු ප්‍රදේශයේ තිබූ ඓතිහාසික පුරාවස්තූන් වීටා විසින් තම රටට ගෙනගොස් ඇත. දැනට, වීටාහි මධ්‍යම කෞතුකාගාරයේ 'මිනාහිදී සොයාගත් පුරාවස්තු' නමින් පුරාවස්තු එකතුවක් ඇත. උතුරු මිනාහි ඉපැරණි දැවමය ව්‍යුහයකට වීටා සටන්කරුවන් විසින් ගිනි තබා ඇත. මිනා කියා සිටින්නේ ඒවා සංස්කෘතික උරුම ප්‍රදේශයකට අයත්ව තිබූ බවයි.

(ඇ) වීටාහි රැඳවුම් කඳවුරකින් පලා ආ සිවිල් වැසියකුවන රිකා පවසන්නේ ඔහුව එහිදී විවිධ පර්යේෂණයන්ට බඳුන් කල බවයි. ඔහු පවසන ආකාරයට, ඔහුව හඳුනා නොගත් වෛරසයකට නිරාවරණය වී ඇත. ඔහුට අනුව, මෙම රැඳවුම් කඳවුරු වල ප්‍රාණ ඇපකරුවන් ලෙස සිවිල් වැසියන් සිය ගණනක් රඳවාගෙන සිටී.

(ඈ) අල්ලාගත් වීටා සටන්කරුවන් දෙදෙනෙකුට මිනා හමුදාවන්ට බැඳීමට බලකර ඇත. අල්ලගත් සටන්කරුවන් තිදෙනෙකු භූගත බංකර තුල රඳවා සිටින අතර, ඔවුන්ට දිනකට ලබාදෙනුයේ එක් ආහාර වේලක් පමණි.

(ඉ) 'මිනාටිස්' සාමාජිකයන් විසින් ආරක්ෂිත ප්‍රදේශයක සිටි පුරුෂයන් සහ පිරිමි දරුවන් 4,000ක් 'මිනාටිස්' සහ මිනා සටන්කරුවන් අතර සන්නද්ධ ගැටුම් පවතින ප්‍රදේශයට රැගෙන ගොස් ඇති බවට චෝදනා එල්ලවී තිබේ. පසුව සොයාගෙන ඇත්තේ මෙම පුරුෂයන් සහ දරුවන් මරා දමා ඇතිබවකි.

6. සන්නද්ධ ගැටුම් පිළිබඳ නීතිය ලෙස හඳුන්වනු ලැබුවද, අන්තර්ජාතික මානුෂවාදී නීතිය පශ්චාත් සන්නද්ධ ගැටුම් කාල පරිච්ඡේදයකදී පවා අදාළ වේ.

ශ්‍රී ලංකාවේ පශ්චාත් යුද සන්දර්භය භාවිතා කරමින් ඉහත ප්‍රකාශය සිද්ධි අධ්‍යයනයක් ලෙස සාකච්ඡා කරන්න.

7. 'අන්තර්ජාතික මානුෂවාදී නීතිය ක්‍රියාත්මක වන්නේ රික්තකයක් තුල නොවේ. බොහෝ අවස්ථාවන්හිදී අන්තර්ජාතික මානව හිමිකම් නීතිය සහ / හෝ අන්තර්ජාතික අපරාධ නීතිය සමඟ අන්තර්ජාතික මානුෂවාදී නීතිය ක්‍රියාත්මක වේ. එකවර බහුවිධ නීති පද්ධතීන් යෙදීමේදී ඇතිවන සංකීර්ණතා, මෙම නීති පද්ධතීන් තුනෙහි විෂය පථය, වලංගුභාවය, සහ අදාළත්වය සම්බන්ධයෙන් පවතින විවිධ මතභේදයන් මඟින් වැඩි කරනු ලබයි.'

ඉහත ප්‍රකාශය සමඟ ඔබ එකඟ වන්නේද? අදාළ නෛතික ප්‍රතිපාදනයන් සහ නඩු තීන්දු භාවිතා කරමින් ඔබේ පිළිතුරට හේතු සපයන්න.

*****